පුදුම නැව්

එස්. සහර්නොව්



පුදුම නැව්

එස්. සහර්නොව්

නොයෙක් නැව් වර්ග මුහුදේ ගමන් කරනවා. සමහර නැව් බොහොම වේගයෙන් දුවනවා.

සමහර නැව් ලොකුයි. සමහර නැව් කුඩායි. එක නැවක් බොහොම ලෙහෙසියෙන් ම ලොකු පාරු තුනක් ඇදගෙන යනවා. තවත් නැවකට ගමන පවා අපහසුයි. ලස්සන හා අවලස්සන නැව් තිබෙනවා.

නැව්වල ඉරණම එකිනෙකට වෙනස්. වාසනාවත් නැව්ද, අවාසනාවත් නැව්ද තිබේ. සමහර නැව් කවදාවත් අමතක වෙන්නේ නැහැ.

නැව් හරියට මිනිස්සු වගේ. එකිනෙකට වෙනස්, ඒ වගේ ම පුදුමාකාරයි.

මුහුදු කොල්ලකාරයෝ

බොහොම ඉස්සර කාලේ නෝර්වේ රටේ වෙරළ දිගේ මුහුදු කොල්ලකාරයින්ගේ බලාකු ඔරු ගමන් කළා. ඒවායේ ලීයෙන් හැදූ මකර හිසක් සවිකර තිබුණා.

එක නගරයක් කොල්ල කෑ මොවුන් ඔරුවලට නැගිලා ආපහු යනකොට මහා කුණාටුවකට අහුවුණා. කුණාටුව මේ ඔරු බටහිර දෙසට ගෙන ගියා. ගොඩබිමක් දකින තුරු ඔහොම පාවෙලා ගියා. අවසානයේ දී කළුපාට කඳු අතර කොළපාට දෙණියක් ඇති රටක වෙරළට මේ ඔරු ආවා. ඒ රටට ග්‍රීන්ලන්තය කියලා නම් තැබුවා. කොල්ලකාරයෝ එම රටට එම නම තැබුවේ ඒ රට කොළපාට හන්දා. කොල්ලකාරයෝ ග්‍රීන්ලන්තයේ පදිංචි වුණා, එතැන ඉඳලා ඇමෙරිකාවට මරුවිලින් ගියා.

හැම ඔරුවක් ම ආපහු ආවේ නැහැ. සමහර ඔරු මුහුදේ ගිලුණා. ඔරුවක් දෙකක් විතරක් සාගරය හරහා කීප වාරයක් ම ගමන් කළා.

මුහුදු කොල්ලකරුවන්ගේ නායකයා මළාම ඔරුවත් එක්ක ඔහුව වළලන සිරිතක් තිබුණා. ශක්තිමත් ඔරු කොහේ ගියත් ආපහු එන බව මුහුදු කොල්ලකරුවෝ විශ්වාස කළා.

කුඩා නැව්

මහා සාගරය හරහා යාමට කොළඹ්බස් ලැහැස්ති වූ විට, ඔහුගේ ගමන නැවැත්වීමට සමහරු ඉදිරිපත් වුණා.

"සාගරයට එහා ලෝකයක් නැහැ. එතැනදී සාගරයත් ඉවරයි. ඊට පස්සෙ විශාල වළක්. ඒ වළ තුළ මහා විශාල යෝධ කුණාටු, නැව් හරවාගෙන එන්ට ඉඩක් ලැබිලා විනාශයෙන් බේරුණත් ආපහු එනකොට බඩගින්න හා ලෙඩ රෝග හන්දා මැරිල යාවි."

කොළඹ්බස් ඒවාට බය වුණේ නැහැ. ඔහු තම නැව් හමුදාව සාගරය හරහා ගෙන ගියා. ඔහුගේ නැව් වටකුරුයි. උසයි. ඒ නැව් බොහොම කුඩායි. මහා කුණාටු ඇති වෙලා විශාල රැළි ඇති වුණාම මේ කුඩා නැව් එකිනෙකාට නොපෙනී ගියා.

කොහොම වුණත් නැව් ඉදිරියට ගමන් කළා. සාගරය හරහා ගිහිල්ලා අලුත් ලෝකය - ඇමෙරිකාව හොයා ගන්න කොළොම්බස්ට පුළුවන් වුණා.

ලෝකය බෝලයක් මෙන් වටකුරු බව පෙනුණා. රුවල් නැව් ලෝකය වටේ ගියා.

නිල්පාට යුද නැව

යුද්ධ නැවක් පාට කරන්නේ සුදු, ළා නිල් සහ කළුපාට තීන්ත වර්ග කවලම් කරලා. "ටිර්පිට්ස්" කියන යුද්ධ නැවට ළා නිල්පාට තීන්ත වැඩියෙන් කවලම් කළ හන්දා, නිල්පාට වුණා.

පැසිස්ට් ජර්මනිය සෝවියට් දේශයට පහර දුන්නා. යුද්ධය පටන් ගත්තා පැසිස්ට්වරු සෙවස්ටපෝල් නගරය වට කළා. වට වී ඇති මේ නගරයේ තුවාල ලබපු සුදු සෙබළුන්වයි, ෆෑනුන්වයි, ළමයින්වයි කොකේසියාවට ගෙන යාම "ටිර්පිට්ස්" යුද්ධ නැවට බාර කළා.

උදේ හිට හවස් වන තුරුම බෝම්බ දමන ජර්මන් අහස් යානා මේ නැව ඔයාමින් මුහුදු උඩින් පියාසර කළා. අහස් යානාවලට අහුවුණා නම් නැවට බෝම්බ දා විනාශ කරාවි. ඕනෑම නැවකට සෙවස්ටපෝල් ඉඳලා කොකේසියා වෙරළට යාමට දවසකුයි, රෑ යකුයි ගත වෙනවා. ජර්මන් අහස් යානා මෙය දැනගෙන හිටියා.

ජර්මන් අහස් යානා හවස ඇද්දිරි වැෂටන තුරු මේ යුද්ධ නැව් සෙව්වා. පහුවදා උදේ පාන්දර ආපහු ඇවිත් මහායන්ට පටන් ගත්තා, ඒත්, නැව හොයාගන්ට බැරි වුණා. කළු මුහුදේ වැඩිම වේගයෙන් දුවන නැව "ටිර්පිට්ස්". සෙවස්ටපෝල් නගරයේ සිට කොකේසියාවේ වෙරළට එක රැයක දී මේ නැව මිනිසුන් අරගෙන ගියා. "ටිර්පිට්ස්" යුද්ධ නැවට මෙතරම් වේගයකින් යන්ට පුළුවන් බව ජර්මන්නු දැනගෙන හිටියේ නැහැ.





දුම් නැව් පරදවන රුවල් නැව

දුම් නැවක් මුහුදේ ගමන් කළා. එය වේගයෙන් යන ලොකු නැවක්. ඈත ඉඳලා සුදුපාට වළාකුළක් වේගයෙන් දුම් නැව දෙසට එන හැටි පෙනුණා. මේ වළාකුළ එන්න එන්න ලොකු වුණා. දුම් නැවේ කපිතාන් දුර බලන කණ්ණාඩියෙන් වළාකුළ දෙස බැලුවා. එය වළාකුළක් නොවෙයි. කුඹ ගස් තුනක් ඇති රුවල් නැවක්.

රුවල් නැවට වඩා වේගයෙන් යන්ට ඕන කියලා ඔහු හිතුවා.

"වේගය වැඩි කරනු!" කපිතාන් අණ කළා. නැවේ දුම් බටයෙන් දුම් ගුළි පිට වුණා. දුම් නැවේ වේගය වැඩි වුණා. ඒ වුණාට රුවල් නැව දුම් නැවට වඩාත් ළං වුණා.

"වේගය තවත් වැඩි කරනු!" කපිතාන් දුම් නැවේ යන්තර පදවන අයට අණ කළා.

නැවේ දුම් බටවලින් වැඩියෙන් දුම් ගුළි පිට වුණා. දුම් නැව මහ මුහුදේ චතුර දෙබෑ කරමින් දුවන හන්දා පෙණ මතු වුණා.

රුවල් නැව පරදින්ට කැමති නැහැ. රුවල් නැව ඔබාහොම ලෙහෙසියෙන් ම දුම් නැව පරදවා දුවලා ගියා.

ඒ රුවල් නැවේ නම "කැටී සාර්ක්". ලෝකයේ වැඩිම වේගයකින් දුවන්ට පුළුවන් එකම රුවල් නැව "කැටී සාර්ක්" බව දුම් නැවේ කපිතාන් දැනගෙන හිටියේ නැහැ. දැන් මේ රුවල් නැව ලන්ඩනයේ නවතා තිබෙනවා. නැව පරණ වෙලා. රුවල් ඉරිලා. ඒත්, දැන් වුණත් මුහුදු යන්ට රුවල් නැව ලෑස්තියි.





මූදු ගිය දවසේ ම ගිලුණු නැව

දවසක් දා සිව්ඩනයේ රජ්ජුරුවෝ නැව් හදන ශිල්පීන් ගෙන්වලා මෙහෙම අණ කළා.

"ලෝකයේ මෙතෙක් හදාපු නැව් අතුරෙන් ඉතාම ලොකු, ඉතාම ලස්සන, ඉතාම වේගවත්, ඉතාම ශක්තිමත් නැව හදන්ට ඕන."

"දේවයන් වහන්ස, නමුත්" නාවුක ශිල්පියෝ රජතුමාගේ අදහසට කැමති වීමට බැරි බව කියන්ට ලැහැස්ති වුණා.

"වහාම වැඩ පටන් ගනිල්ලා!"

එවැනි නැවක් හැදුවා ඒ නැවේ කාලතුවක්කු, ලස්සන සැරයිලි, ලස්සන කාමර, බොහෝ උසැති කුඹ ගස් බොහොම තිබුණා. "ගුස්ටාව් වාස්සා" යන නම එම නැවට තැබුවා.

"මය නැව මූදු යන හැටි බලමුකෝ!" එහෙම කීවේ පළපුරුදු නැවියන් ය.

"ගුස්ටාව් වාස්සා" නැව මූදු ගිය දවසේ දී ම ගිලා බැස්සා.

ඊට අවුරුදු තුන් සියයකට පසු එම නැව මූදු පතුලෙන් ගොඩ අරගෙන වරායේ තැබුවා. එම නැවට මූදු යන්ට බැහැ. 'එකවර ඉතාම ලොකු, ඉතාම ලස්සන, ඉතාම වේගවත් හා ශක්තිමත් වීම කළ නැකි දෙයක් නොවෙයි.

දුම්රියක හැපුණු අවාසනාවන්ත නැවක්

මේ අවාසනාව සිදු වුණේ ඉතාලියේ ජෙනුවා වරායේ දී ය.

මහා සාගරයේ ගමන් කළ නැවක් නැවතුම් පොළට ආවා. ඒ නැව ලොකු ගමනක් ගිහිල්ලා ආවා විසාරයි. සාගරයේ දී නැවට දිය යට තිබුණු විශාල ගල් පරුවතවලින් සහ වැලි ගඩොල්වලින් බේරෙන්නට පුළුවන් වුණා. විශාල කුණාටුවලින් ගැලවුණා. මෙවැනි හැම කරදරයකින් ම බේරිලා ගම් නැව වරායට ආවා.

වරායේ වෙරළ අයිනේ ඒ වෙලාවේ දුම්රියක් ගමන් කළා. මේ දුම්රිය හිටි හැටියේ ම පිළි පැනලා මුහුදු අයිනට ඇවිත් නැවතුණා.

එවිට නැව මුහුදු අයිනටම ඇවිත් දුම්රියේ හැප්පුණා. මේ හත්දා නැවේ ඇණිය කැඩුණා. බොහෝ දවස් යන තුරු නැවට ආයෙමත් මුහුදු යාමට පුළුවන් වුණේ නැහැ.

පිළි පැන්න දුම්රියට ද ඒ වගේ ම හානි සිදුවුණා.



"වික්ටෝරියා" නැවේ අවසාන ගමන

ඉංග්‍රීසි නැව් හමුදාවයි ප්‍රංශ නැව් හමුදාවයි අතර ලොකු යුද්ධයක් ඇති වුණා. ඉංග්‍රීසි නැව් හමුදාවේ නායකයා අද්මිරාල් නෙල්සන්. මුහුදේ රජා කවුද කියලා තීරණය කළේ මේ යුද්ධයයි.

නෙල්සන්ගේ එක ඇහැක් අන්ධයි. පේන්නෙ නැති ඇහැට දුර බලන කණ්ණාඩිය තියල ප්‍රංශ නැව් හමුදාව දෙස ඔහු බැලුවා.

"බයවීමට තරම් දෙයක් පේන්නෙ නැහැ!" නෙල්සන් කිව්වා.

ඒ සටනින් ඉංග්‍රීසි කාරයින්ට ජය ලැබුණා. සටන ඉවර වෙන්ට ඔන්න මෙන්න කියලා තියෙද්දී නෙල්සන්ට මාරක වෙඩි පහරක් වැදුණා. ඔලොකුම ඉංග්‍රීසි නැවේ සිටි නෙල්සන් වෙඩිපහර කා ගෙන බිම ඇද වැටුණා. ඒ නැවේ නම තමා "වික්ටෝරියා".

නෙල්සන්ගෙ මළ සිරුර "වික්ටෝරියා" නැවෙන් වරායට ගෙන ගියා. නැවේ රුවල් ප්‍රංශ වෙඩි පහරින් විනාශ වෙලා තිබුණා.

අද්මිරාල් කෙනෙකු හා සාමිචරයෙකු වන නෙල්සන්ගෙ මළ සිරුර වළලා එතැන සිහිවටනයක් හැදුවා.

"වික්ටෝරියා" නැව තවමත් වරායේ මුල්ලක තබා ඇත.





විප්ලවයේ නැව

ලෙනින්ග්‍රාඩ් නගරයේ නේවා ගඟේ ලස්සන ඉවුරු තියෙනවා. ඒවාවල තියෙන ලෝකඩ හා කිරිගරුඬ සිහිවටන බොහොම ලස්සනයි. හිම කාලෙට වැහි පොද වෙනුවට, හිම පියලි වැටෙන කොට සිහිවටන සුදු රෙදිවලින් එතුවා වගේ පේනවා.

බොහොම වටිනා එක සිහිවටනයක් නේවා ගඟ මැද තියෙනවා. ඒ "අව්රෝරා" යුද්ධ නැවයි.

කම්කරුවන්ගේ හා දුප්පත් ගොවීන්ගේ ඔක්තෝබර් විප්ලවය පටන්ගත් හැටියෙම, මේ නැව ගඟ හරහා ගිහිල්ලා හතුරෝ හිටිය හිම මාළිගාවට කාල තුවක්කු එල්ල කළා.

හිම මාළිගාව අල්ලා ගැනීමට දැනුම් දෙන වෙඩි තැබුවෙ "අව්රෝරා" නැවයි.

මේ නැව ළඟ හැමදාම බොහෝ මිනිස්සු රැස්වෙනවා. බොහෝ මවිලාවක් ඔවුන් නැව දිහා බලනවා.

නෙවා ගඟේ එහා ඉවුරේ හිම මාළිගයයි. දැන් එතන කෞතුකාගාරයක්.

මාළිගාව ඉදිරිපිට මෙහා ඉවුරේ "අව්රෝරා" නැවයි. එහි කාලතුවක්කු ඕමට හරවා තියෙනවා.

දැන් මේ නැවේ අයිතිකාරයෝ ළමා යුද්ධ නැවයෝ ය.

පුදුම නැව්

එස්. සහර්නොව්

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, අල්ෆ්‍රඩ් ඇතැ, ගුණී. රත්නවීර මාවත, කොළඹ 08

ISBN 978-955-1319-02-1

Rs.175/-